## WEATHER FORECAST FOR 09th June 2019
## (Issued at 1200 noon on 08th June 2019)

**South-west monsoon is established over the island. Therefore, showery and windy conditions are expected to enhance further (particularly in the South-western part).**

Showers or thundershowers will occur at times in Western, Southern, Central, Sabaragamuwa and North-western provinces.
Heavy falls in-between 100-150 mm can be expected at some places (particularly in Kaluthara, Rathnapura, Galle, Matara, Gampaha and Kegalle districts).
Fairly heavy falls about 100 mm can be expected at some places in North-western province.

Showers or thundershowers may occur at several places elsewhere over the island.

Fairly strong gusty winds up to 50 kmph are also likely over the country, particularly in western slope of the central hilly areas and Northern, North-central and Uva provinces and in Nuwara-Eliya, Ampara, Batticaloa and Puttalam districts and strong winds up to 50-60 kmph are also likely over the Jaffna district and Pottuvil area.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

නිරිතදිග මෝසම් තත්ත්වය දිවයින හරහා ස්ථාපිත වී ඇත. ඒ හේතුවෙන්, දිවයිනේ (විශේෂයෙන් නිරිතදිග කොටසේ) දැනට පවතින වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීම තවදුරටත් අපේක්ෂා කෙරේ.

බස්නාහිර, දකුණු, මධ්‍යම, සබරගමුව සහ වයඹ පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඇතැම් ස්ථාන වලට (කළුතර, රත්නපුර, ගාල්ල, මාතර, ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්කවල) මි.මි 100-150 ත් අතර තද වැසි බලාපොරොත්තුවේ.

වයඹ පළාතේ ඇතැම් ස්ථාන වලට මි.මි 100 ක පමණ තරමක තද වැසි ඇති විය හැකි අතර, දිවයිනේ සෙසු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින හරහා, විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත් උතුරු, උතුරු-මැද සහ ඌව පළාත්වලත් නුවරඑළිය, අම්පාර, මඩකලපුව සහ පුත්තලම දිස්ත්‍රික්කවලත් විටින් විට හමන පැ.කි.මී. 50 දක්වා තරමක් තද සුළං ඇතිවිය හැකි අතර යාපනය දිස්ත්‍රික්කයේත් පොතුවිල් ප්‍රදේශයේත් පැ.කි.මී. 50-60 දක්වා තද සුළං ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 08th June 2019)

**South-west monsoon is established over the island. Therefore, showery and windy conditions are expected to enhance further in the South-western and Southern sea areas to the island.**

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Mannar to Hambantota via Colombo and Galle. Heavy showers can be expected at some places in the South-western and Southern sea areas.

Showers or thundershowers may occur at several places in the other sea areas around the island.

Winds will be South-westerly and speed will be 30-40 kmph in the sea areas around the island.

The sea area off the coast extending from Trincomalee to Mannar via Kankasanturai and sea area off the coast extending from Matara to Pottuvil via Hambanthota can be rough at times as the wind speed can increase up to 60-65 kmph.
The sea area off the coast extending from Mannar to Matara via Colombo can be rough at times as the wind speed can increase up to (50-55) kmph.

The other sea areas around the island can be fairly rough at times as the wind speed can increase up to 50 kmph.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regards**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2019 ජුනි මස 08 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.

නිරිතදිග මෝසම් තත්ත්වය දිවයින හරහා ස්ථාපිත වී ඇත. ඒ හේතුවෙන්, දිවයිනට නිරිත දෙසින් සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීම තවදුරටත් අපේක්ෂා කෙරේ.

මන්නාරම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. නිරිත සහ දකුණු දෙසින් වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වල තද වැසිද ඇතිවිය හැක.
දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.
දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළඟේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

ත්‍රිකුණාමලයේ සිට කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා සහ මාතර සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 60-65 දක්වා ද, මන්නාරම සිට කොළඹ හරහා මාතර දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා ද, වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩි වන අතර මුහුද තරමක් රළු වේ.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.
ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/06/08
Time : 1220hrs
D (Ops)/DC/ADO
DISASTER MANAGEMENT CENTRE